# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2113/63 - 2019 මාර්තු මස 08 වැනි සිකුරාදා - 2019.03.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 15/2014 (II)

### 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 52 වන වගන්තියේ (2) වන උපවගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 58 වන වගන්තිය යටතේ නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**සජිත් ප්‍රේමදාස,**
නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා

2019 මාර්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග 2019 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (තීරකවරයන් ලියාපදිංචි කිරීම) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු ''අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි තීරකවරයෙකු ලෙස අදාළ තැනැත්තා ලියාපදිංචි වී ඇත්නම් මිස යම් තැනැත්තකු ඉදිකිරීම් වැඩ සම්බන්ධයෙන් ගිවිසුමකට අදාළ ආරවුලක තීරකවරයකු නොවිය යුතු ය.

3. (1) 2 වන නියෝගය යටතේ තීරකවරයකු වීමට අපේක්ෂා කරන සෑම තැනැත්තකු විසින් ම, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආපසු නොගෙවන සැකසුම් ගාස්තුව සමග අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකෘතියකින් අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත අයදුම් කළ යුතු ය.

(2) (1) වන උපනියෝගය යටතේ සෑම ඉල්ලුම්කරුවකුහට ම පහත දැක්වෙන සුදුසුකම් සහ පළපුරුද්ද සතු විය යුතු යː-

*(අ)* ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු, වාස්තු විද්‍යා හෝ ප්‍රමාණ සමීක්ෂණ ප්‍රථම උපාධියක්;

*(ආ)* අධ්‍යයන සුදුසුකමක් මගින් ලබාගත් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ හෝ ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනයේ හෝ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනයේ පූර්ණ සාමාජිකත්වය; සහ

*(ඇ)* පූර්ණ සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු යටත් පිරිසෙයින්, වසර දහයකවත් වන අදාළ පළපුරුද්ද.

(3) මේ නියෝග යටතේ කරනු ලබන ඉල්ලීමක්, දැනුම සහ නිපුණතා විස්තර කොට දක්වන දෙදහසකට නොඅඩු වචන සංඛ්‍යාවකින් සමන්විත වාර්තාවක් සමග ඉදිරිපත් කරනු ලැබිය යුතුය. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්,අවශ්‍ය වන අවස්ථාවක දී, වැඩිදුර තොරතුරු ඉදිරිපත් කරන ලෙස ඉල්ලුම්කරුට නියම කළ හැකි ය.

4. (1) 3 වන නියෝගය යටතේ ඉල්ලීමක් ලැබුණු පසු, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, නිර්දේශ ලබාගැනීම සඳහා එම ඉල්ලීම සහ ලේඛන, අධිකාරිය විසින් පත් කරන ලද කමිටුවකට යොමු කරනු ලැබිය යුතු ය.

(2) කමිටුවේ නිර්දේශය ලැබුණු පසු, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්,මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ලියාපදිංචි කිරීමේ ගාස්තුව ගෙවීමෙන් පසු එකී තැනැත්තා තීරකවරයෙකු ලෙස ලියාපදිංචිකර, ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීම හෝ එකී තැනැත්තා තීරකවරයෙකු ලෙස ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කර, එකී ප්‍රතික්ෂේප කිරීමට හේතු සටහන් කළ යුතු ය. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඔහුගේ තීරණය පිළිබඳ ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දිය යුතු අතර, එකී තැනැත්තා තීරකවරයකු ලෙස ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවක දී ඔහු විසින් ඊට හේතු සඳහන් කළ යුතු ය.

5. සෑම ලියාපදිංචි කිරීමේ සහතිකයක් ම අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකෘතියක විය යුතු අතර, එකී ලියාපදිංචි කිරීමේ සහතිකය,කලින් ප්‍රත්‍යාදිෂ්ට කළ හොත් මිස,එහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් සඳහා වලංගු විය යුතු අතර,එහි නිශ්චිතව දක්වා ඇති යම් නියමයන්ට සහ කොන්දේසිවලට ද යටත් විය යුතු ය.

6. යම් තීරකවරයකු විසින්,2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග හෝ රීති හෝ එකී ලියාපදිංචි කිරීමේ සහතිකයේ යම් නියමයන් සහ කොන්දේසි උල්ලංඝනය කර ඇති බවට තමා සෑහීමට පත්වන්නේ නම්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, 4 වන නියෝගය යටතේ නිකුත් කළ ලියාපදිංචි කිරීමේ සහතිකය ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

7. (1) 4 වන නියෝගය යටතේ නිකුත් කළ ලියාපදිංචි කිරීමේ සහතිකයක්, එකී ලියාපදිංචි කිරීමේ සහතිකයේ වලංගු කාලය ඉකුත් වීමට දින තිහකට නොඅඩු කාලසීමාවකට පෙර,මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අලුත් කිරීමේ ගාස්තුව ද සමග තත් කාර්යය සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ඉල්ලීමක් මත අලුත් කරනු ලැබිය හැකි ය.

(2) තීරකවරයා විසින්,2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන නියෝග හෝ රීති හෝ එකී ලියාපදිංචි කිරීමේ සහතිකයේ යම් නියමයන් සහ කොන්දේසි පිළිපැද ඇති බවට තමා සෑහීමට පත් වන්නේ නම් පමණක්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් එකී ලියාපදිංචි කිරීමේ සහතිකය අලුත් කළ යුතු ය.

8. අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් සෑම තැනැත්තකුම විසින්,2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 53 වන වගන්තියේ විධිවිධාන යටතේ පිහිටුවන ලද අභියාචනා මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

9. (1) මේ නියෝගවල 2 වන නියෝගයේ සඳහන් විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, අධිකාරියේ දැනටමත් ලියාපදිංචිව සිටින්නා වූ ද,මේ නියෝග ක්‍රියාත්මක වන දින කටයුතු කරමින් සිටින්නා වූ ද යම් තීරකවරයකුට ලියාපදිංචි කිරීමේ සහතිකයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් දක්වා තීරකවරයකු ලෙස දිගටම කටයුතු කිරීමට අවසර ලැබිය යුතු ය.

(2) (1) වන උපනියෝගයේ සඳහන් තීරකවරයන් විසින්, ලියාපදිංචි කිරීමේ සහතිකයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඉකුත්වීමට දින තිහකට නොඅඩු කාලයකට පෙර 7(1) වන නියෝගය ප්‍රකාර ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කරනු ලැබිය යුතු ය.

(3) 3 (2) වන නියෝගයේ විධිවිධාන (1) වන උපනියෝගයේ සඳහන් තීරකවරයන් සඳහා ආදාළ නොවිය යුතු ය.

## උපලේඛනය

***සැකසුම් ගාස්තුව,ලියාපදිංචි කිරීමේ ගාස්තුව සහ ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුව***

(3(1),4(2) සහ 7(1) වන නියෝග)

| *විස්තරය* | *බදු රහිතව ගාස්තුව (රු)* |
|---|---|
| සැකසුම් ගාස්තුව | රු. 3,000.00 |
| ලියාපදිංචි කිරීමේ ගාස්තුව | රු. 20,000.00 |
| ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුව | රු. 20,000.00 |

03-1068

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.